# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.02.26

වේලාව : පෙ.ව.11.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | ගරු සභාපති | - | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 02. | ගරු නගර සභා මන්ත්‍රී | - | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 03. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. | ගරු නගර සභා මන්ත්‍රී | - | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06. | ගරු නගර සභා මන්ත්‍රී | - | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 07. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඩබ්. විමලසේන මැතිතුමා |
| 08. | ගරු නගර සභා මන්ත්‍රී | - | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගීනොවූවෝ**:-

| | | | |
|---|---|---|---|
| 01. | ගරු උපසභාපති, | - | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නාගරික ලේකම් | - | ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා |

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථා කරමින්, අද දින පැවැත්වෙන සභා රැස්වීමට සඳහා සහභාගීවීමට පැමිණ සිටින, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමා හා පුවත්පත්කලාවේදී මහතුන් සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන් පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි, බළන්ගොඩ නගර සභාව/බළන්ගොඩ ප්‍රාදේශීය සභාව හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග නඩත්තුව සහ සංවර්ධනය පිළිබඳ සාකච්ඡාවත්, ඊට අමතරව බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ අප ජලය කළමනාකරණය පිළිබඳ සාකච්ඡාවත් පැවැත් වූ අතර, එම සාකච්ඡාවන් දෙක මෙම සභාවේ අභිවෘද්ධියට විශාල වශයෙන් ඉවහල්වන වන බවත් ඒ සඳහා සහභාගී වූ මෙම සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත තමාගේ කෘතවේදිතාව පළකර සිටින බව දැන්වීය.

2008 වර්ෂය තුළ මෙම නගර සභා බල ප්‍රදේශය තුළ ජාතික සවිය, ගම නැගුම, මග නැගුම වැඩ සටහන් උපයෝගී කරගෙන විශාල වැඩ කොටසක් ඉටුකර තිබෙන බවත්, මෙම වර්ෂය සඳහා ද ජාතික සවිය ගම නැගුම වැඩ සටහන යටතේ ද කර්මාන්ත ආරම්භ කිරීමට නියමිතව ඇති බවත් දැන්වීය, ඊට අමතරව පළාත් සභා ආධාර යටතේ සබරගමුව පළාත් සභාවේ ගරු පළාත් මාර්ග සංවර්ධන , ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා එක් ගරු නාගරික මන්ත්‍රීවරයෙකුට රු.ලක්ෂ 05 බැගින් වෙන්කිරීම සඳහා අදාල ඇස්තමේන්තු එවන ලෙස දන්වා එවා ඇති අතර, මේ වන විට අදාල ඇස්තමේන්තු සකස් කර එතුමා වෙත යවා ඇති බවත් සඳහන් කරමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට ලේකම් මහතා වෙත ආරාධනය කරන ලදී.

(03)**<u>2009.01.29වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:</u>**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා කථා කරමින්,පසුගිය සභා වාර්තාවේ තීරණ අංක:03 යටතේ මහජන පොළ ඉදිකිරීම කඩිනමින් 2009 ජනවාරි මස ආරම්භ කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව තීරණය කරන ලදි. යනුවෙන් සඳහන් කර ඇති බවත් එය බළන්ගොඩ මහජන පොල ඉදිකිරීම සභා සම්මත විය යන්න ලෙස නොව, එම ස්ථානයේ පොළ ඉදිකිරීම සම්බන්ධයෙන් තමන් විරෝධය පළකල බවත්, ඒ අනුව ඒකමතිකව නොව සභා සම්මත විය යනුවෙන් සංශෝධනය විය යුතු බවත් දන්වන ලදී.

ගරු සභාපතිතුමා විසින් මෙම අවස්ථාවේ දී කථා කරමින්, මේ සම්බන්ධව දැනට අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් පොළ ඉදිකිරීම සම්බන්ධව ප්‍රකාශයන් කිරීම සුදුසු නොවන බව දැන්වීය.

2009.01.29 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **<u>පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:</u>**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **<u>සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:</u>**

05:01 <u>විදුණැන පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ පරිගණක පාඨමාලා ආරම්භ කිරීම:</u>

මෙම නගර සභාව මගින් ආරම්භ කර ඇති විදුණැන තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයෙහි පහත දැක්වෙන පරිගණක පාඨමාලාවන් ආරම්භ කිරීමට අදහස් කර ඇති බැවින්, ඒ සඳහා සභාවේ අනුමැතිය පතමින් පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

| පාඨමාලාවේ නම | විස්තරය | අයකරනු ලබන මුදල |
|---|---|---|
| 1. Computer for Primary Education | පරිගණක භාවිතයෙන් ප්‍රාථමික අධ්‍යාපනික කටයුතු කරගැනීම සඳහා මගපෙන්වීම<br>වයස් සීමාව : 3 වසර සිට 5 වසර පංති සඳහා<br>පාඨමාලා කාලය: මාස 05 | මාසිකව ගාස්තු අයකරනු ලැබේ.<br>මාසික ගාස්තුව:<br>රු.500+VAT=560/-. |
| 2.Basic Application Computer Course | මූලික පරිගණක යෙදවුම් මෘදුකාංග පරිහරණය කිරීම | මාසිකව ගාස්තු අයකරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | පිළිබඳ අවබෝධ කරවීම. වයස් සීමාව : 6 වසර සිට 8 වසර පංති සඳහා පාඨමාලා කාලය : මාස 04 | මාසික ගාස්තුව : රු.600=VAT=672/- |

05:02 **ස්වේච්ඡා සේවක පුහුණු වැඩ සටහනක් පැවැත්වීම**

උක්ත කරුණට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

නගර සභාව විසින් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති අතරින් ජපන් ස්වේච්ඡා වැඩ සටහනත්, අපජලය කළමනාකරණ වැඩ සටහනත් ප්‍රමුඛත්වය ගන්නා අතර, මෙම ව්‍යාපෘති වලට අදාළව කලයුතු සමීක්ෂණ, දැනුවත් කිරීම් වැඩ සටහන් සඳහා ස්වේච්ඡාවෙන් දායක විය හැකි කණ්ඩායමක් තෝරා පුහුණු කරගත යුතුව ඇති බවත් මෙම වැඩ සටහන සඳහා බලශක්ති සංසදය උදව් උපකාර කරනු ලබන බව දන්වා ඇති බැවින්, නාගරික මන්ත්‍රී කොට්ඨාශ මට්ටමින් ස්වේච්ඡාවෙන් දායක විය හැකි 07 දෙනෙකු බැගින් තෝරා දෙන ලෙසත් මෙම අය සඳහා පළමුව දින 03 පුහුණු වැඩ සටහනක් සංවිධානය කර ඇති බවත්, ඊට අමතරව පහත සඳහන් පුහුණු වැඩ සටහන් ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් එමගින් අවධාරණය කර තිබිණ.

1. මූලික ප්‍රථමාධාර
2. මූලික හෙද පුහුණුව
3. ආපදා කළමනාකරණය

මෙම ස්වේච්ඡා සේවකයින්ට අමතරව ග්‍රාම නිලධාරීන් ,සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ද සහභාගී කරවීමට ද සභාව නිර්දේශ කළ අතර, මේ සඳහා වැය වන වියදම ගණනය කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වෙත දැණුම් දීමටත් සභාව තීරණය කරන ලදී. එමෙන්ම , එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සභාව අනුමත කරන ලදී.

05:03 **වරිපනම් බදු නිදහස් කිරීම - රාස්සගල පාර අංක:252**

බළන්ගොඩ, රාස්සගල පාරේ පිහිටි අංක: 252 දරණ ගොඩනැගිල්ල කාලයක සිට පදිංචිය අතහැර දමා ඇති බැවින්, දැනට කොටසක් දිරාපත්ව කඩා වැටී ඇති බවත් , මෙය නැවත ඉදිකරන තෙක් වරිපනම් බද්දෙන් නිදහස් කිරීම සුදුසු බැව් ආදායම් පරීක්ෂක මහතා විසින් වාර්තා කර තිබෙන බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදුව, වරිපනම් බදු නිදහස් කිරීම සභාව අනුමත කරන ලදී.

05:04 **හෝටල් සඳහා කඩ කාමරයක් ඉල්ලීම ( ඩී-12)**

උක්ත හිසින්යුතුව බළන්ගොඩ, කරව්කැටිය, උඩකන්ද පාර යන ලිපිනයේ පදිංචි එම්. විජේකුමාර යන අය විසින් එවා ඇති 2009.02.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ බස්නැවතුම්පලේ අංක: බී. 03 දරණ කඩ කාමරය තමා විසින් නිසි පරිදි බදු මුදල් ගෙවා පවත්වාගෙන ගිය බවත්, නමුත් මෑතක දී මෙම නගර සභාව විසින් කල දැණුම් දීමකට අනුව, මෙම කඩ කාමරය වසා දැමීමට සිදු වු බවත්, එම නිසා ඩී.12 දරණ කඩ කාමරය හෝටලයක් (කැන්ටිම සමඟ) පවත්වාගෙන යාම සඳහා බදු ලබාදෙන ලෙස එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී. ටෙන්ඩර් කිරීමෙන් පසුව ලබාගැනීමට හැකි බව සභාව අනුමත කරන ලදී.

05:05 **අංක:157 දරණ කාගීල්ස් ෆුඩ්සිටි ගොඩනැගිල්ල සම්බන්ධවයි**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ , පරණ පාර අංක: 157, කාගීල්ස් ෆුඩ්සිටි ආයතනයේ කළමනාකරු මංගල මහින්ද යන අය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී. එහි දී අදාල ගොඩනැගිලි සැලසුම් අනුමත කරනොගෙන ගොඩනැගිල්ල ඉදිකර ඇති බැවින්, මෙයට අදාළ මුදල් අඩුකල නොහැකි බවට සභාව අනුමත කරන ලදී.

05:06 **බළන්ගොඩ නව බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ ඩී.12 දරණ කඩ කාමරය:**

බළන්ගොඩ නව බස්නැවතුම්පලේ ඩී.12 දරණ කඩ කාමරය තක්සේරු මුදලට තමා වෙත බදු ලබාදෙන ලෙස ඉල්ලමින්, බළන්ගොඩ නව බස්නැවතුම්පල කඩ කාමර අංක: ඩී.13 හි බදුකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, ටෙන්ඩර් කිරීමෙන් ලබාදීමට අනුමත කරන ලදී.

05:07 **බළන්ගොඩ නව බස්නැවතුම්පල කඩ කාමර සම්බන්ධවයි**

**ඉහත** සදහන් කරුණට අදාළව බළන්ගොඩ නව බස්නැවතුම්පල ව්‍යාපාරිකයින් විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නව බස්නැවතුම්පලේ සුළු කඩ කාමර කිහිපයක් පමණක් විවෘතව පවතින අතර, ඉතිරි සියල්ල වසා දමා ඇති බැවින්, පාලු ස්වභාවයක් දක්නට ලැබෙන බවත්, එම නිසා මෙහි පාරිභෝගියකයන් ගැවසීමට ද අකමැති බැවින් හා මෙම තත්ත්වය දීර්ඝකාලීනව පැවතියහොත් මෙහි විවෘතව පවතින සුළු කඩ කාමර ප්‍රමාණය ද තව නොබෝ දිනකින් වැසී යනු ඇති බැවින්, පහත දැක්වෙන විකල්ප යෝජනා කෙරෙහි සභාවේ අවධානය යොමු කරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

01. කුළිය ගෙවමින් හෝ නෙගෙවමින් වසා ඇති කඩ කාමර නැවත පවරා ගැනීම.
02. අවුරුද්දකට යටත් වු සහන මිලකට නැවත සියලුම කඩ කාමර ලබාදීම
03. මාසයක් තුළදී ලබාගත් කඩ කාමර නැවත විවෘත කරවීම
04. අවුරුද්දකට පසු නැවත නියමිත කුළිය අයකරගැනීම

ලිපියෙහි සඳහන් කරුණු පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බැවින්, මේ සම්බන්ධව කඩහිමියන් දැනුවත් කිරීමට තීරණය කරන ලදී.

05:08 **ව්‍යාපාරික කටයුතු නතරකිරීම නිසා බදු ගෙවීමට අපහසු බැව් දන්වා සිටීම.**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ , කොටුගොඩැල්ල යන ලිපිනයේ පදිංචි ඩබ්.එම්. ගුණපාල මහතා විසින් එවා ඇති 2009.02.17 දිනැති ලිපිය සභාගත කරන ලදි.

තානායම් පිවිසුම් පාරේ අංක: 28 හා 30 දරණ ගොඩනැගිල්ලේ ඇති අපහසුතාවය හා පැන නැගී ඇති ප්‍රශ්ණ නිසා 2007 වර්ෂයේ අගෝස්තු මස සිට ව්‍යාපාරික කටයුතු නතර කරනු ලැබූ බැවින්, වරිපනම් බදු ගෙවීම අපහසු බවත්, ගොඩනැගිල්ල සම්බන්ධව පවතින

ගැටළු නිරාකරණය වනතෙක් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට නොහැකි බවත් එමගින් දන්වා තිබිණ. වරිපනම් බදු නිදහස් කිරීම අනුමත කරන ලදී.

05:09 **ආදර්ශ පරිසර නගර ලෙස සංවර්ධනය කිරීම - 2009 වසර**

ඉහත කරුණට අදාළව පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් එවා ඇති 2009.02.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත සඳහන් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන පියකරු පුරවර වැඩ සටහන යටතේ 2009 වසර තුළ තෝරාගත් නගර කිහිපයක් ආදර්ශ නගර වශයෙන් නම් කර පරිසර හිතකාමී ලෙස සංවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් දියත් කිරීමට අදහස් කරන අතර, ඒ සඳහා මෙම නගරය ද ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන අතර, එහි දී මෙම නගර සභාවේ යෝජනා හා අදහස් ලබාගැනීමට අදහස් කර ඇති බවත්, ආදර්ශ පරිසර හිතකාමී නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ දී එම නගරයේ පහත සඳහන් කාර්යයන් කිරීමට යෝජිත වන අතර, මේ සඳහා පරිසර අමාත්‍යාංශය සහ අදාළ නගර සභාව ඒකාබද්ධ වී ආයතන දෙකෙහිම දායකත්වයෙන් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත්, මෙම නගරය ද ආදර්ශමත් පරිසර හිතකාමී නගරයක් ලෙස සංවර්ධනය කිරීමට එකඟවන්නේ නම් පහත කරුණු සැලකිල්ලට ගෙන දළ ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබිණ.

1. නාගරික තුරු උද්‍යාන ඉදිකිරීම
2. නාගරික වන ගොමු ඇතිකිරීම.
3. නාගරික අලංකරණය සඳහා පැළ සහ මල් සිටුවීම.
4. විධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් ඇතිකිරීම. ඒ සඳහා අපද්‍රව්‍ය සම්පත් පියසක් ඇති කිරීම සහ නාගරික ප්‍රජාව කසළ වර්ගීකරණය සහ කසළ බඳුන් සඳහා යොමුකරලීම.
5. ප්‍රමාණවත් නාගරික වැසිකිළි පහසුකම් ඇතිකිරීම
6. ප්‍රමාණවත් පදික වේදිකා පහසුකම් සංවර්ධනය කිරීම
7. පාර මාරුවන ස්ථාන සළකුණු කර පවත්වාගෙන යාම
8. නගරය පුරා අපිළිවෙළට දැන්වීම් හා පෝස්ටර් ඇලවීම වෙනුවට පොදු දැන්වීම් පුවරු ඇතිකිරීම.
9. කර්මාන්ත සහ සේවා මධ්‍යස්ථාන මඟින් විධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමට වැඩ සටහන් ඇතිකිරීම.
10. නගර සීමාව තුළ පදිංචි නිවැසියන් අලංකාර පරිසරයක් ඇති කිරීම සඳහා යොමු කරවීම.
11. ආදර්ශ පරිසර පාඨ සහිත දැනුවත් කිරීමේ පුවරු ප්‍රදර්ශනය කිරීම.
12. නාගරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ නිරන්තර වැඩ සටහන් ඇතිකිරීම සහ අනෙකුත් ආදර්ශ නගර සමඟ සම්බන්ධතා ඇතිකිරීම.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සභාව විසින් අනුමත කරන ලදී. මේ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර යැවීම සුදුසු බවට ද සභාව තීරණය කරන ලදී.

05:10 <u>**අත්තිකාරම් මුදලක් ගෙවීම - මළ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය**</u>

මෙම නගර සභාව මගින් පවත්වාගෙන යනු ලබන මළ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ වැඩ සටහන සඳහා coconut Fiber කෙඳි ලබාගැනීම වෙනුවෙන් 2009.01.15 වන දින පුවත්පත් දැන්වීමක් පළකරන ලදුව, Thurul S.A.F.E Enviroment ආයතනයෙන් ලද මිළ ගණන් 2009.01.24 වන දින මෙම සභාවේ පැවති ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත් අතර, අදාළ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට එම ආයතනය වෙත මුළු වටිනාකමින් 50% ක අත්තිකාරමක් ඉල්ලා ඇති බව විෂය භාර නිලධාරිණිය විසින් සභාව වෙත වාර්තා කර තිබෙන බව ලේකම් මහතා විසින් සභාව වෙත දන්වන ලදුව, මෙම කාර්යය කරන එකම ආයතනය මෙය වන බැවින් හා කඩිනමින් මෙම ව්‍යාපෘතිය අවසන් කල යුතු බැවින් ව්‍යාපෘතියේ මුළු වටිනාකමින්" 50% ක අත්තිකාරම් ගෙවීම සභාව විසින් අනුමත කරන ලදී.

05:11 <u>**කාබනික පොහොර වලට රොක්පොස්පේට් එකතුකිරීම**</u>

කාබනික පොහොර වල ගුණාත්මකභාවය වැඩිදියුණු කර අගනා පොහොරක් Roc compost නමින් නිෂ්පාදනය කිරීම සඳහා ලංකා පොස්ටිපේට් ලිමිටඩ් ආයතනයෙන් Roc pospate මිළදී ගැනීමට යෝජනා කරන බවත්, මේවා මිශ්‍ර කරන ලද කොම්පෝස්ට් පොහොර 50 කි.ග්‍රෑ. මිටියක් රු.500/- ක මුදලකට අලෙවි කිරීම සුදුසු බව සඳහන්

කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:12 **<u>වරිපනම් බදු නිදහස් කරන ලෙස ඉල්ලීම - තානායම් පිවිසුම් පාර අංකඃ 08</u>**

උක්ත කරුණට අදාළව ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

තානායම් පිවිසුම් මාර්ගයේ අංකඃ 08 දරණ දේපල එම්.එල්.එම්. අබුසාලී නමින් තහඩු සෙවිල් කාර්යාලයක් ලෙස තක්සේරු ලේඛණගතව පවතිනි අතර, දැනට මෙම කාමරයේ දැනට පොදුජන එක්සත් වතු කම්කරු සමිති කාර්යාලයක් වර්ෂ ගණනාවක් සිට පවත්වාගෙන යන බවත්, සමාජ සුභ සාධන පරිවාස හා ළමා රක්ෂක පළාත් සභා ගරු අමාත්‍ය ජී.එම්. කරුණාපාල මැතිතුමා විසින් මෙම ස්ථානයට පවතින වරිපනම් බදු නිදහස් කරන ලෙස ඉල්ලීමක් කර ඇති බවත්, 2008.12.31 දිනට රු.3223/- ක හිඟ මුදලක් පවතින අතර, වර්ෂයකට රු.846/- බැගින් මෙම කාමරයට වරිපනම් බදු අයකරන බවත් එමගින් වාර්තා කර තිබුණි.

පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව හිඟ මුදල කපා හැර වරිපනම් බදු නිදහස් කිරීම සභාව අනුමත කරන ලදී.

05:13 **<u>බළන්ගොඩ නාලන්ද එල්ලාවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක ඒකකය රත්නපුරයට ගෙනයාම සම්බන්ධවයි.</u>**

ඉහත සදහන් කාරණයට අදාළව, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා විසින් එවා ඇති 2009.02.19 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ නාලන්ද එල්ලාවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක ඒකකය රත්නපුරයට ගෙන යාම සම්බන්ධව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ඒකමතික විරෝධතාව පළකල අතර ඒ බව අතිගරු ජනාධිපතිතුමා, ගරු වෘත්තීය පුහුණු අමාත්‍යතුමා සහ ගරු සබරගමුව ආණ්ඩුකාරතුමාට දන්වා යැවීමට කටයුතු කරන ලද බවත්, එබැවින්, මෙම සභාව විසින් ද ඊට විරෝධතාව ප්‍රකාශ කර අදාල ආයතන දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස එමගින්ඉල්ලා තිබිණි.

මේ සම්බන්ධව අවධානය යොමුකල සභාව, මෙම පරිගනක ඒකකය රත්නපුරයට ගෙන යාම සම්බන්ධව මෙම සභාවේ විරෝධතාව පළකල අතර, මෙය නැවත ලබාදෙන ලෙස අදාල බලධාරීන්ගෙන් ඉල්ලීමක් කිරීමටත් තීරණය කරන ලදී.

05:14 **<u>පෙට්ටිගල පාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිරිපිට මාර්ග තදබදය</u>**

බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සේවය ලබාගැනීමට පැමිණෙන පිරිස් පෙට්ටිගල පාර ආරම්භයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිරිපිට ත්‍රීරෝද රථ සහ වෙනත් වාහන නවතා තැබීම හේතුවෙන් එම ස්ථානයේ මාර්ග අවහිරතාවක් පැන නැඟී ඇති බැවින් මෙම අවහිරතාවන් ඉවත් කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, මාර්ග තදබදය හා මහජනතාවට හා දේපළ වලට අනාරක්ෂිත තත්ත්වයක් උද්ගත විය හැකි බැවින්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිරිපිට රථවාහන නතර කරතැබීම තහනම් කිරීම සුදුසු බවටත් අනුමත කරන ලද අතර, මේ සම්බන්ධව බළන්ගොඩ පොලිස් ස්ථානය වෙත දැණුම්දීමටත්, රථ වාහන නවතා තැබීම තහනම් යනුවෙන් දැන්වීම් පුවරුවක් එම ස්ථානයේ සවිකිරීමටත් තීරණය කරන ලදී.

05: 15 **<u>බළන්ගොඩ බස්නැවතුම්පල අංකඃ C 46 / B 20</u>**

බළන්ගොඩ නව බස්නැවතුම්පලේ අංකඃ**C 46** දරණ කඩ කාමරය බදුගෙන සිටින බී.බී. අබේසිංහ / **ඊ 20** කඩ කාමරය බදුගෙන සිටින රසික ප්‍රසාද් යන විසින් එම කඩ

කාමර වල බදු අයිතිය වෙනත් අයෙකුට පැවරීම සඳහා අවසර ඉල්ලා ඇති බව විෂය භාර නිලධාරිණිය විසින් සභාව වෙත වාර්තා කර ඇති බව ලේකම් මහතා සභාව වෙත අවධාරණය කල අතර, මෙවැනි ඉල්ලීමකදී කටයුතු කල යුතු වූ ආකාරය සම්බන්ධව සභා තීරණයක් ගෙන තිබෙන බැවින්, එම තීරණය අනුව කටයුතු කරන ලෙස එම නිලධාරිණිය වෙත දැණුම්දීමට සභාව අනුමත කරන ලදී.

05:16 **<u>බස්නැවතුම්පලේ කඩ කාමර බදුදීම:</u>**

ඉහත කරුණට අදාළව , ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.බළන්ගොඩ නව බස්නැවතුම්පලේ පහත සඳහන් කඩ කාමර දැනට සීල් තබා වසා දමා ඇති බවත්, මෙම කඩ කාමර සියල්ලම කුලී පදනම මත මාස 06 ක කුලි තැන්පත් මත ලබා දී ඇති බවත්, මෙම කඩ කාමර වල මාසික කුළිය තක්සේරු දෙපාර්තමේන්තුවේ කුළියට වඩා වැඩියෙන් ලබාගෙන ඇති නිසා, පවත්වාගෙන යෑමට නොහැකි බව පෙනී යන බවත්, එබැවින්, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති කුළියට හෝ ලබාදීම සභාවට වාසිදායක බව එමගින් වාර්තා කර තිබුණු අතර, 2009.02.28 වන දින වනවිට මාස 06 ක ඉක්මවා යන හිඟ කුලී සහිත කඩ කාමර කිහිපයක් පවතින බව සඳහන් කර තිබුණි.

| කඩ කාමර අංකය | 2008.12.31 ට හිඟ මුදල | |
|---|---|---|
| D – 12 | 109882/- | |
| D – 15 | 38803/- | |
| D – 21 | 47500/- | |
| D – 47 | 23395/- | } 2009.02.28 දිනට චෙක්පතක් |
| B – 18 | 49058/- | |

ලබාදීඇත.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව, නැවත භාරදී ඇති සියළුම කාඩකාමර ටෙන්ඩර කිරීමට සභාව අනුමත කරන ලදී.

05:17 **<u>මූල්‍ය විගණනය - 2008</u>**

විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් 2008 වර්ෂයේ මෙම නගර සභාවේ කටයුතු සම්බන්ධව කරන ලද මූල්‍ය විගණනයේ , විගණන විමසුම ලැබී ඇති බවත්, එම විමසුමෙන් පෙන්වා දී ඇති අඩුපාඩු , අයකරගැනීම් ආදිය සම්බන්ධව ලේකම් මහතා විසින් සභාව වෙත පැහැදිලි කිරීමක් කරන ලදී.

මුදල් අයකරගැනීම සම්බන්ධව අදාළ අයවලුන් දැනුවත් කිරීමටත්, ඔවුන් මුදල් නොගෙවන්නේ නම්, නීතිමය පියර ගැනීම සුදුසු බවටත්, ප්‍රදේශයේ රාජ්‍ය ආයතන වල සංවර්ධන කාර්යයන් ඉටුකිරීමට සහයෝගය දැක්වීම සභාවේ යුතුකමක් වන බැවින්, එම ආයතන වලින් අයවිය යුතු මුදල් නිදහස් කිරීමට සුදුසු බවටත් අනුමත කරන ලදී.

05:18 **<u>නිවාඩු අනුමත කිරීම:</u>**

අද දින පැවැත්වෙන සභා රැස්වීමට සහභාගීවීමට නොහැකි බව දන්වමින්, ගරු උපසභාපතිතුමා විසින් ෆැක්ස් පණිවුඩයක් එවා තිබෙන බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාව අනුමත කරන ලදී.

05:19 **<u>විදේශ පුහුණු වැඩ සටහන - 2008</u>**

2009.01.29 දින පැවති මහ සභා රැස්වීමේ දී 05:14 යටතේ ඉදිරිපත් කරන ලද යෝජනාව සංශෝධනය කිරීමට සභාව තීරණය කරන ලදී.

ඒ අනුව, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂ විසින් එවන ලද සීඑල්අයිජී හා 2008.09.24 දිනති ලිපියට අනුව පළාත් පාලන කොමසාරිස්ගේ 2008.10.08 ලිපිය අනුව ඉන්දියානු සංචාරය සඳහා දැනට අයදුම්පත්‍ර යවා ඇති ගරු සභාපතිතුමා සහ වැඩ අධිකාරී යු.වී.දෑල බණ්ඩාර මහතා යොමු කිරීමට ඒකමතිකව සභා සම්මත විය. එමෙන්ම, මෙම සංචාරය සඳහා දෙදෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු.184520/- ක මුදල හා අනෙකුත් ගමන් වියදම් සභා අරමුදලින් දැරීමටත් සභාව අනුමැතිය ලබාදෙන ලදී.

එමෙන්ම, මෙම දෙදෙනාට අමතරව ගරු මන්ත්‍රීතුමන්ලාට ද අවස්ථා සලසා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙම යෝජනා ගැන සලකා බැලූ සභාව, විසින් කැමති මන්ත්‍රීතුමන්ලා 05 කුද, මෙම සංචාරය සඳහා යොමුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී. එහිදී එක් අයෙකු වෙනුවෙන් රු.92260/- බැගින් සභා අරමුදලින් වියදම් දැරීමට සභාව අනුමත කරන ලදී. එමෙන්ම, මේ සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීමට තීරණය කරන ලදී.

5.20 **දැයට කිරුළ ප්‍රදර්ශනය**

දැයට කිරුළ ප්‍රදර්ශනයේ අනුමත ඇස්තමේන්තුව 3,63000/- ක් වන අතර, එයින් රු.150000/- ක මුදලක් අත්තිකාරමක් ලෙස ගෙවා ඇති බවත්, එබැවින් , ඉතිරි මුදල මොරටුව, රාවතාවත්ත පාර, සෙන්සර් ආයතනය වෙත ගෙවීම නිර්දේශ කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

1. කොම්පෝස්ට් ව්‍යාපෘතිය අලුතින් ජායාරූප හා අලුතින් පැනල් සවිකිරීම.

2. බළන්ගොඩ නගර ආකෘතිය සකස් කිරීම

3. ප්‍රදර්ශන කුටිය සකස් කරදෙන ලදී.

මේ පිළිබඳව සාකච්ඡා කළ සභාව, අදාල ආයතනය විසින් යථෝක්ත කාර්යය සිදුකර තිබෙන බැවින්, අදාල මුදල් ගෙවීම සුදුසු බවට අනුමත කරන ලදී.

06. **රු. 10000/- ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම ( 2009.01.28 සිට 2009.02.20 දක්වා )**

| | | | |
|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ<br>පළාත් පාලනය පිළිබඳ ශ්‍රී .ලං.ආ<br>පළාත් පාලන ආයතන සදහා පාරිසරික සිතියම් සකස් කිරීම සදහා ගාස්තු ගෙවීම. | රු. | 18000.00 |
| 02. | ජයන්ති ටයර් සෙන්ටර්<br>227-5020 ගලී බවුසරයේ හා 226-7521 ටිපර් රථයට 700x16 ප්‍රමාණයේ ටයර් 04 මිළදී ගැනීම. | රු. | 53392.00 |
| 03. | සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා<br>2008.12.26 - 2008.12.31 දක්වා ඉන්ධන බිල පියවීම | රු. | 58342.46 |
| 04. | සමෘද්ධි බැංකු- සමංගමය,බළන්ගොඩ<br>කරවිකැටිය ගල්වල පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් කොටස. | රු. | 111716.79 |

| | | | |
|---|---|---|---|
| 05. | සමෘද්ධි බැංකු සංගමය, බළන්ගොඩ.<br>කරව්කැටිය ගල්වල පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ<br>අවසන් කොටස. | රු. | 102370.89 |
| 06. | ජයන්ති ටයර් සෙන්ටර්<br>46-3164 ට්‍රේලරයට 750x16 ප්‍රමාණයේ ටයර් 02 හා<br>ටියුබ් 02 මිළදී ගැනීම. | රු. | 29046.00 |
| 07. | ඉඹුල්පේ විවිධ සේවා<br>2008.12.31 සිට 2009.10.06 දක්වා ඉන්ධන බිල | රු. | 88612.20 |
| 08. | ඉඹුල්පේ විවිධ සේවා<br>2009.01.06 සිට 2009.01.10 දක්වා ඉන්ධන බිල | රු. | 51736.00 |
| 09. | සාමාන්‍යාධිකාරී ලං.වි.බ.ම.<br>2009 ජනවාරි මස විදුලිය බිල පියවීම | රු. | 18436.95 |
| 10. | කළමණාකරු, ජල සම්පාදන මණ්ඩලය<br>2009 ජනවාරි මස ජල බිල පියවීම<br>පොදු වෙළඳසල/පිංතාලිය | රු. | 10046.40 |
| 11. | ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>බැංකියවත්ත සදහා සිමෙන්ති මිටි 150 ලබාගැනීම | රු. | 117750.00 |
| 12. | නිහාල් ට්‍රේඩින් කම්පැණි<br>නව තොරතුරු මධ්‍යස්ථානය හා කියවීම් ශාලාව<br>සදහා තීන්ත ලබාගැනීම. | රු. | 73273.55 |
| 13. | යුනිසොන් ඔටෝ පාට්ස්<br>සයිරන් විදුලි ලාම්පු හා නලා පද්ධතියක් සවිකිරීම. | රු. | 23000.00 |
| 14. | පී.ජී. එන්ටර් ප්‍රයිසස්<br>කෘෂ කැබ් රථයට ස්ටියරින් පද්ධතියක් සවිකිරීම. | රු. | 38500.00 |
| 15. | වජිර සංජීව විජේකෝන්<br>දැයට කිරුළ ප්‍රදර්ශනය සදහා ප්‍රදර්ශණ භාණ්ඩ සැකසීම<br>සඳහා අත්තිකාරම් මුදලක් ගෙවීම. | රු. | 100000.00 |
| 16. | සරුකෙත ගොවිසේවා<br>මෙම සභාවේ අලංකාරය සදහා මල් පැල ආවරණය<br>සඳහා 100xMx03M තවාන් නෙට් 01 ලබාගැනීම | රු. | 37125.00 |
| 17. | ජේ.එෆ්. ඩිස්ට්‍රිබියුටර්ස්<br>පී.වී.සී. එස්ලෝන් පයිප්ප 12 මිළදි ගැනීම | රු. | 73758.52 |
| 18. | නිව්ජෝති ස්ටෝර්ස්<br>කාර්යාල ලිපි ද්‍රව්‍ය ලබාගැනීම. | රු. | 17007.50 |
| 19. | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>2008 දෙසැම්බර්<br>2287275/2287153/2286596 /urbandg @ shnet.lk | රු. | 16071.44 |
| 20. | සාමාන්‍යාධිකාරී ලං.වි.බ.ම.<br>2009 ජනවාරි විදුලි විදුලි පියවීම. | රු. | 70184.00 |

21. බී. ගුණරත්න
2009.01.15 දින සිට 2009.01.31 දක්වා කසල එකතු කිරීම හා
ප්‍රවාහනය කිරීම සඳහා සේවකයින් යෙදවීම. රු. 86708.00

22. සාමාන්‍යාධිකාරී ලං.වි.බ.ම.
නව බස්නැවතුම්පලේ විදුලිය හිග මුදල ගෙවීම
මිල වෙනස්වීම මත තොග සැපයුම - 6832.62
2008 අප්‍රේල් අඩුවෙන් ගණනය - 2456.40
2008 ජුලි බිල අගය වෙනස්වීම - 3179.40 රු. 12468.42

23. ඉඹුල්පේ විවිධ සේවා
බැංකියවත්ත ව්‍යාපෘතිය සඳහා සිමෙන්ති ලබාගැනීම රු. 155600.00

24. කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය
වැලිහරනාව අතුරු මාර්ගය සංවර්ධනය කර කොන්ක්‍රීට්
කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හා ගිවිසුම් ආපසු ගෙවීම රු. 98402.75

25. ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්
2287023/2287022/2288565/2287024/2452931/2452932 රු. 22335.72

26. ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය
විදුලි බිල පියවීම - 2009 ජනවාරි , කාර්යාලය රු. 15352.50

27. රිචඩ් ප්‍රැන්සිස්
බැංකියවත්ත සඳහා වැලි කියුබ් 14 1/2 මිළදී ගැනීම රු. 51112.50

28. සීගිරි ප්‍රින්ටර්ස්
කාර්යාල කටයුතු සඳහා වන ඝන අපද්‍රව්‍ය මිළදී
ගැනීමේ පොත් 10
බස්රථ ගාස්තු ටිකට් පොත් 100
අනුකූලතා සහතික පොත් 100 රු. 10300.00

29. ආර්.රොස්ලින්
විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගෙවීම. රු. 385432.00

30. ඩබ්.ඒ.එන්.සී. හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්
බස්නැවතුම්පල ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපිට වැසිදිය
ආවරණයක් සඳහා රු. 219682.90

31. ඉඹුල්පේ විවිධ සේවා
2009.01.11 සිට 2009.01.19 දක්වා ඉන්ධන බිල රු. 90286.20

32. දේශීය ආදායම් කොමසාරිස්
මුද්දර ගාස්තු ගිණුම - 2008.01.01 සිට 2008.12.31 සඳහා
මුද්දර ගාස්තු ගෙවීම. රු. 12285.00

33. දේශීය ආදායම් කොමසාරිස්
2008 දෙසැම්බර් මාසය අයකරගත් බදු මුදල් ප්‍රේෂණය කිරීම රු. 83324.90

34. සෙනොක් ට්‍රේඩ් කම්බයින්
ජේ.සී.බී.යන්ත්‍රය සේවා කිරීමට අවශ්‍ය ෆිල්ටර් හා බකට්
එකට දත් මිළදී ගැනීම රු. 19544.00

35. දේශානී හාඩ්වෙයාර්
කර්මාන්ත අංශය හා සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය
ද්‍රව්‍ය ලබාගැනීම. රු. 13889.00

36. එල්.ඊ.සී.සී. මෙටල් ක්‍රෂර්
බැංකියවත්ත අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට අවශ්‍ය ගල් ලබාගැනීම
6x9 - 23
4x4- 14
¾ - 17
1 ½ - කියුබ් 01
2' - කියුබ් 02 රු. 192939.70

37. ඉඹුල්පේ විවිධ සේවා
2009.01.09 සිට 2009.01.23
දක්වා ඉන්ධන බිල පියවීම. රු. 76412.92

38. ඉන්දික එරික් සිසිල්
එස්ජීඑල්ඒ 4223 ලොරි රථයෙන් බළන්ගොඩ සිට
අවිස්සාවේල්ල දක්වා කොම්පෝස්ට් පොහොර ප්‍රවාහනය
කිරීම හා දැයට කිරුළ ප්‍රදර්ශනයේ ප්‍රදර්ශණ භාණ්ඩ
බළන්ගොඩ දක්වා ගෙන ඒම. රු. 16000.00

39. ඩබ්.ඒ.එන්.සී. හාඩ්වෙයාර්
බැංකියවත්ත මල ප්‍රවාහන පද්ධතිය සඳහා ගේට්ටුවක්
සකස් කරගැනීම. රු. 13500.00

40. ටී.ඒ.ටී.එම්. තෙබුවන
8558 ට්‍රැක්ටරය හා 3164 ට්‍රේලරය අලුත්වැඩියා කිරීම. රු. 21390.00

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

07. **<u>ඇස්තමේන්තු අනුමත කිරීම</u>**

01. බළන්ගොඩ නගර සභා ළදරු පාසල ළමුන්ට
දැකුම්කළු පරිසරයක් ඇතිකිරීම සඳහා තීන්ත
ආලේප කිරීම රු.68502.70
02. පුස්තකාලය හා පුස්තකාලයට යාබඳ වැසිකිළිය
තීන්ත ආලේප කිරීම කර්මාන්තය රු.92060.57
03. බැංකියවත්ත ගලී ප්‍රතිකාරක පද්ධතිය ටැංකි සහ
මායිම් තාප්පය තීන්ත ආලේප කිරීම රු.159377.94
04. බළන්ගොඩ නගර සභා කාර්යාල ගොඩනැගිල්ල
තීන්ත අලේප කිරීම රු.574795.94
05. බැංකියවත්ත අලුතින් කපරාරු කර තීන්ත ආලේප
කිරීම, පැරණි ගොඩනැගිල්ල පැරණි බැම්ම
( පළමු හට් එක බැම්ම ) සහ ඉවුර අසල ඉදිකල
අලුත් බැම්ම තීන්න ආලේප කිරීම රු.155402.86

06. බුලත්ගම සුසාන භූමිය ගොඩනැගිල්ල තීන්ත ආලේප
කර අලුතින් වැසිකිලිය සාදා සුදර්ශනපුර පාර බැම්
බැඳ ( යාබඳ ) වැඩ නිමකිරීම රු.220746.44

07. බැංකියවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ
ඉඩම් මායිමේ පිහිටි පැරණි බිලොක්ගල් බැම්ම කපරාරු
කිරීම සහ ඉඩමට ඇතුළු නොවන අයුරින් බැම් බැඳ
වැඩ නිමකිරීම , මෝටර් කාමරය අසල බැම්ම කාණුව
සමඟ බැඳීම ර 15,470.45

08. තානායම් අළුත්වැඩියාව රු. 1,997,000.00

මෙම ඇස්තමේන්තු සියල්ල සභාව විසින් සභා සම්මත කර පොදු අරමුදලින් වියදම් දරා සියළු කර්මාන්ත සිදුකිරීමට අනුමැතිය ලබාදෙන ලදී.

08.1 **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

11. **යථා පරිදි කල් දී ඇති යෝජනා**ඃ නැත

## 09. **ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම**ඃ

09:01 **227-5020 ගලී බවුසරයට රේඩියෝ කැසට් යන්ත්‍රයක් සවිකිරීම**

මෙම නගර සභාව සතු ගලි බවුසරයට රේඩියෝ කැසට් යන්ත්‍රයක් සවිකිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| අයිතමය | රන්ජන් රේඩියෝ | නිව් වෙල්කම් එන්ටර්ප්‍රයිසස් | ටී සිලෝන් ...... |
|---|---|---|---|
| 1. කෙන්වුඩ් CD | රු.13000.00 | රු.13500.00 | රු.14000.00 |
| 2. ටෙයෝටා ස්පීකර් | රු. 3000.00 | රු. 3600.00 | රු. 4100.00 |
| 3. කන්වර්ටර් ( 24 V 12 V ) | රු. 4000.00 | රු. 4250.00 | රු. 4750.00 |
| එකතුව | රු. 200000.00 | රු.21350.00 | රු.22850.00 |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන පිළිගැනීම සභාව අනුමත කරන ලදී.

09:02 **GK-6227 ට්‍රැක්ටරයට ටයර් මිළදී ගැනීම**

| ටයර් වර්ගය හා ප්‍රමාණය | ජයන්ති ටයර් සෙන්ටර් | PS ටයර් වර්ක්ස් | බළන්ගොඩ ටයර් සර්විස් |
|---|---|---|---|
| 11x28 සියැට් ටයර් 02 | රු.67900/- | රු.65000/- | රු.68000/- |
| 600x16 සියැට් ටයර් 02 | 18700/- | 15900/- | 16900/- |
| | 86600/- | 80900/- | 84900/- |

ඉහත මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති PS ටයර් වර්ක්ස් ආයතනයේ මිළ ගණන පිළිගැනීමට සභාව අනුමත කරන ලදී.

09:03 **GK-1483 ජොන්ඩියර් ට්‍රැක්ටරයේ අළුත්වැඩියාව**

2009.01.24 වන දින පැවති මහ සභා රැස්වීමේ දී තීරණ අංකඃ 06:25 අනුව ඉහත අංක දරණ ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියාවන් සඳහා දේව් ට්‍රැක්ටර් සමාගමෙන්

ඇස්තමේන්තුවක් ලබාගැනීමට තීරණය කර ඇත. එකී තීරණය පරිදි ට්‍රැක්ටරයේ අළුත්වැඩියාවන් වෙනුවෙන් (QT/2009/Feb/34 අංක දරණ 2009.02.19 දිනැති ) ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධව සලකා බලන ලද සභාව, ඇස්තමේන්තුවේ සඳහන් රු.581546.50 ක් වු මුදල අළුත්වැඩියාව සිදුකරගැනීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

09:04 **GK-6227 ජොන්ඩියර් ට්‍රැක්ටර් ට්‍රැක්ටර් රථය**

2008.12.24 දින පැවති මහ සභාවේ තීරණ අංකඃ 05:09 පරිදි. ඉහත අංක දරණ ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියාව වෙනුවෙන් වු රු.428697.50 ක් වු බිල්පත සභාව විසින් පිළිගන්නා ලදුව, එම අළුත්වැඩියාව සිදුකර ට්‍රැක්ටර් රථය කාර්යාලයට එවා ඇත.

එම අළුත්වැඩියාව නිසියාකාරව සිදුකර ඇත්දැයි ඩිපෝ ඉංජිනේරු මහතාගෙන් වාර්තාවක් ලබාගෙන බිල්පතේ සඳහන් රු.428697.50 ක් වු මුදල ගෙවීම අනුමත කරන ලදී.

09:05 **කාර්යාලයේ පරිගණක කාමරය සඳහා මේස සකස් කිරීම**

කාර්යාලයේ පරිගණක කාමරය සඳහා මේස සකස් කිරීම වෙනුවෙන් කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| ආයතනය | මුදල |
|---|---|
| 1. රසාංජලී වුඩ් හවුස්, අවිස්සාවේල්ල | රු.156000/- |
| 2. කලර්වුඩ් ෆර්නිචර්, කොස්ගම | රු.180000/- |
| 3. නිව්ලංකා ෆර්නිචර්, තල්දුව | රු.179500/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති රසාංජලී වුඩ් හවුස් ආයතනය වෙතින් අදාල කාර්යය ඉටුකරගැනීම සුදුසු බවට සභාව අනුමත කරන ලදී.

09:06 **56-1906 කෘෂ කැබ් රථය අළුත්වැඩියාව :**

| | |
|---|---|
| 1. ගාමිණී ඔටෝ ඉංජිනියරින්,බළන්ගොඩ | රු.153515/- |
| 2. ඉංජිනියරින්,බලන්ගොඩ | රු.187300/- |
| 3. නැෂනල් මෝටර්ස්,බළන්ගොඩ | රු.172450/- |

අවම මිළ ගණන් පිළිගැනීමට සභාව අනුමත කරන ලදී.

09:07 **කාර්යාලීය උපකරණ මිළදී ගැනීම:**

| | | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් | දම්රෝ | චතුර ෆර්නිචර්ස් |
|---|---|---|---|---|
| 01. | වානේ අල්මාරි | 16700.00 | 16300.00 | 20200.00 |
| | | ( 7.5% වට්ටම්) | (වට්ටම් නැත) | |
| 02. | විධායක පුටු | 8750.00 | 9550.00 | 14400.00 |
| 03. | අත්ඇඳි සහිත පුටු | 5900.00 | 7190.00 | 9200.00 |
| 04. | විධායක මේස | 43400.00 | 43665.00 | 48000.00 |
| 05. | විධායක පුටු | 23565.00 | 10180.00 | 14400.00 |
| 06. | අමුත්තන්ගේ පුටු | 14500.00 | 8565.00 | 11100.00 |

ඉහත මිළ ගණන් අතුරින් වානේ අල්මාරි සඳහා 7.5% වට්ටමක් හා වානේ අල්මාරි සඳහා ඇල්ෆා වානේ අල්මාරි නිමවුම ඉතා විශිෂ්ඨ මට්ටමකින් පවතින බැවින්, ඒවා එම ආයතනයෙන් අල්මාරි 04 ක් මිළදී ගැනීමටත් එක් විධායක මේස පුටුවක් හා ඇඳි සහිත

කුඩා ප්‍රමාණයේ කැරකෙන පුටු 06 ක් එම ආයතනයෙන් මිළදී ගැනීමට සභාව අනුමත කරන ලදී. විධායක මේසයකට ගැලපෙන පුටු දම්රෝ ආයතනයේ ඇති බැවින් එම ආයතනයෙන් විධායක මේස 02 ක් හා එයට අදාළ එක් මේසයකට ගැළපෙන පුටුව , අමුත්තන්ගේ පුටු 02 මිළදී ගැනීමට සභාව විසින් අනුමත කරන ලදී.

09:08 **ගලී ප්‍රතිකාගාරයේ වහලය සැකසීම සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම**

| | ඩබ්.ඒ.එන්.සී. හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් | එස්.ඩී.සී.සී. හාඩ්වෙයාර් | සේනානී හාඩ්වෙයාර් |
|---|---|---|---|
| 01. 6' - 26 ගි ටකරන් 25 | 28625.00 | 29000.00 | 29375.00 |
| 02. 8'- 26 ටකරන් 25 | 38150.00 | 38500.00 | 38625.00 |
| 03. රිජ්කැප් 80' | 11920.00 | 12400.00 | 12480.00 |

අඩුම මිළ ගණන් ලැබී ඇති ඩබ්.ඒ.එන්.සී.ආයතනයෙන් මිළදී ගැනීම අනුමත කරන ලදී.

09:09 **තානායම අළුත්වැඩියාව උළු මිළදී ගැනීම.**

| | පතිරාජ ටයිල් ෆැක්ටරි | සදුන් උළු කම්හල | ආනන්ද හාඩ්වෙයාර් | එච්.එල්.පී. ටිම්බර් | දේශානී හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| තැටි උළු | 21.50 | 22.00 | 36.00 | 32.00 | 30.00 |
| මුදුන් උළු | 30.00 | 32.00 | 50.00 | 50.00 | 36.00 |

පතිරාජ ටයිල් ෆැක්ටරි ආයතනයෙන් මිළදී ගැනීම අනුමත කරන ලදී.

09:10 **බැංකියවත්ත මලාපවහන ප්‍රතිකර්ම පද්ධතිය ඉදිකිරීම කර්මාන්තයේ අපද්‍රව්‍ය වියලනය( Dry Bed ) යටතේ වහල සැකසීමේ කාර්යය ( අයිතම අංක 06 සිට 14 දක්වා) සභාවෙන් ලබාදෙන ද්‍රව්‍ය යොදා කාර්යය නිමකිරීමට දක්ෂ කාර්මිකයින් වෙතින් කැඳවන ලද මිල ගණන්**

| **ආයතනයේ නම** | **ඉදිරිපත් කර ඇති මිළ ගණන්** |
|---|---|
| 1. කේ.ජී.කන්ස්ට්‍රක්ෂන් ඩී.13. ඉහල මහල,බස්නැවතුම්පල බළන්ගොඩ. | රු.75605.00 |
| 2. ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් වෑගපිටිය,මොරහැල,බලන්ගොඩ. | රු.71960.00 |
| 3. නාලක කන්ස්ට්‍රක්ෂන් නාලක කටුපිටිය ,මොරහැල,බළන්ගොඩ. | රු.72984.00 |

ඉහත මිළ ගණන් අතුරින් අවම මිළ ඉදිරිපත් කර ඇති ඩබ්.ඒ.එන්.සී. හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.71960/- ක මිළ ගණන් පිළිගැනීම සභාව අනුමත කරන ලදී.

10. **යෝජනා**

10:01 **ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

01. නගර සභා කාර්යාල ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීම.
02. ළදරු පාසල් ගොඩනැගිල්ල තීන්න ආලේප කිරීම.
03. පුස්තකාල ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීම
04. බැංකියවත්ත නයට්සොයිල් ටැංකි සහ මායිම් තාප්පය තීන්ත ආලේප කිරීම.
05. බැංකිවත්ත පැරණි බැම්ම කපරාරුව තීන්න ආලේප කිරීම සහ අලුත් බැම්ම ( දෙවැනි හට් එක අසල ) තීන්ත ආලේප කිරීම.
06. බැංකියවත්ත ප්‍රධාන ගේට්ටුව අසල පීල්ල ඉදිකිරීම.
07. තානායම අළුත්වැඩියා කිරීම.
08. කාර්යාලයට කැමරාවක් මිළදී ගැනීම.

මෙම යෝජනා සියල්ල සභාව විසින් අනුමත කරන ලදි.

10:02 **ගරු නාගරික මන්ත්‍රී - ධර්මසේන සමරසිංහ මැතිතුමා**

01. බළන්ගොඩ නගර සභාවේ හිටපු සභාපතිවරයෙකු හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ

කිලිෆර්ඞ් සේනක රත්වත්තේ මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළකිරීම. මෙම අභාවය සම්බන්ධව බළන්ගොඩ නගර සභාවේ ශෝකය පවුලේ ඥාතීන් වෙත දන්වා යැවීමට ඒකමතිකව තීරණය කරන ලදී.

02. තරුණ බෞද්ධ සමිති ශාලාව ගොඩනැගීම සඳහා පැවති පොළ පිහිටි ගල්වල ඉඩම ලබාගැනීම. ගරු පුජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් පර්චස් 40 ක ඉඩම් කොටසක් තරුණ බෞද්ධ සමිති ශාලාවක් ඉදිකිරීම සඳහා ලබාගැනීමට තීරණය කරන ලදී.

03. වොලිබෝල් ( අත්පන්දු ) ක්‍රීඩාපිටිය සකස් කිරීම. මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

04. සරස්වතී පාර දෙපස ශුද්ධ කර , සුසාන භූමිය ශුද්ධ කර ඒ සඳහා මුරකරුවකු යෙදවීම.සරස්වතී පාර දෙපස ශුද්ධ කිරීම සුදුසු වන අතර, රු.3000/- ක දීමනාවක් ගෙවා මුරකරුවකු සේවයට යෙදවීමටත් සභාව අනුමත කරන ලදී.

10:03 **ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

01. බළන්ගොඩ නගර සභාවට අයත් මාර්ග සංවර්ධනය කිරීම සඳහා අඩි 1 1/2 විෂ්කම්භයෙන් යුතු හියුම් පයිප් ලබාගැනීම ගැනීම.
02. කිරිදිගල රබර්වත්ත පාර අඩි 50 ක් කොන්ක්‍රීට් කිරීම.
03. අනඳමෙත්ගම මාර්ගයේ දෙපස කාණු ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගොඩදැමීම.
04. වැලිහරනාව කිරිදිගල ජනපද පාර අබලන් වී කැලෑ වැවී ඇති බැවින්, එම ප්‍රතිසංස්කරණය කිරීම.
05. කිරිඳිගල මැද පාර සංවර්ධනය කිරීම.
06. දේගපිටිය පාර (පාලම ද ඇතුලත්ව) සංවර්ධනය කිරීම.
07. සුදර්ශනගම හා අනඳමෙත්ගම ප්‍රදේශවාසීන්ට ජලය ලබාදීම සඳහා බට ලබාදීම.
08. මුගුණමලේ සහ දොරවෙල ප්‍රදේශවාසීන්ට පානීය ජල පහසුකම් ලබාදීම.
09. මෙම නගර සභාවේ ත්‍රීරෝද රථයේ සේවය සඳහා යොදවා ඇති විදුලි කම්කරු රංජිත් මහතා විටී පහන් නඩත්තුව සඳහා නිදහස් කිරීම.

මෙම යෝජනා සභා සම්මත විය.

11. **කාරක සභා වල වාර්තා සලකා බැලීම**:

11:01 2009.02.25 වන දින පැවති තානායම් කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදුව එම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

බළන්ගොඩ තානායම පවත්වාගෙන යන ලද බදුකරු විසින් ගොඩනැගිල්ලේ සියළු උපකරණ සහ ඇතැම් සවිකිරීම් ද , ගොඩනැගිලි කොටස් ද ගලවා ඉවත්කරගෙන ගොස් ඇති බැවින්, මෙම ගොඩනැගිල්ල සභාව වෙත ලබාගත්ත ද ක්ෂණිකව එහි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යා හැකි තත්ත්වයක නොපවතින බව ගරු සභාපතිතුමා විසින් දැන්වීය. එසේම , මෙය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ගලවා ඉවත් කර ඇති උත්සව ශාලාව හා අබලන් වහල ද ගොඩනැගිල්ලේ බොහෝ කොටස් ද අළුත්වැඩියා කර පින්තාරු කල යුතුව ඇති බවත්, මෙම අළුත්වැඩියාවන් ප්‍රමාදවීම හේතුවෙන් මෙම ස්ථානයේ බොහෝ කල් වසා තැබීමට සිදුවන බවත් මෙතෙක් පවත්වාගෙන ආ ව්‍යාපාරික කටයුතු හා ගණුදෙනුකරුවන් ඉදිරියේ දී අහිමිවීමේ අවධානමක් පවතින බවත් සඳහන් කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව , මෙම අළුත්වැඩියා කඩිනමින් නිමකර මෙම ස්ථානය පාරිභෝගිකයින් සඳහා වහාම විවෘත කිරීම සුදුසු බවත්, එබැවින් , බළන්ගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය මඟින් සකස් කර ඇති ඇස්තමේන්තුව අනුව මෙම කාර්යයෙහි වැඩ කොටස් කඩිනමින් නිමකරවීමටත්, තානායම් වියදම් සඳහා අය වැය ලේඛනයේ මුදල් වෙන් කර නොමැති බැවින් 3.3.518 IV ( තානායම් අළුත්වැඩියාව ) ලෙස නව වැය ශීර්ෂයක් ඇතිකර එමගින් රු.ලක්ෂ 25 ක් වැයකිරීමටත් , එම වියදම් 2006 හා 2007 වර්ෂයන් සඳහා මෙම සභාවට පළාත් සභාවෙන් ලැබුණු අතිරික්ත මුද්දර ගාස්තු වලින් වියදම් පියවාගැනීමත් සුදුසු බව මහ සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

එසේම මෙම තානායම පවත්වාගෙන යාමට අවශ්‍ය පහත සඳහන් කාර්ය මණ්ඩලය අළුතින් බඳවා ගැනීම සදහා තනතුරු 06 ක් ඇතිකිරීමට සභාව අනුමත කරන ලදී. මු.රෙ.71 යටතේ අනුමැතිය ලබාගැනීමටත් තීරණය කරන ලදී.

01. කළමනාකරු - 01
02. වේටර් - 03
03. අරක්කැමි - 01
04. අරක්කැමි සහායක - 01

11:02 2009.01.01 සිට 2009.01.31 දක්වා මෙම සභාව සතු වාහන සදහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් එය සම්මත කරන ලදී.

12. **ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරිම**:

12:01 2009 ජනවාරි මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | රු.9522370.26 |
| වෙනත් ලැබීම් | රු.1956466.84 |
| | ------------------ |
| මුළු ලැබීම් | රු.7578837.10 |
| | |
| පුනරාවර්තන වියදම් | රු.2281317.04 |
| වෙනත් ගෙවීම් | රු. 12394610.04 |
| | ------------------ |
| මුළු ගෙවීම් | **රු.14675927.08** |
| | ============ |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

13. **<u>වෙනත් කරුණු :</u>**

13:01 **<u>ගරු නගර සභා මන්ත්‍රී,ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :</u>**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , සඳුන්ගම ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ දායකත්වයෙන් රක්ෂිතයට අයත් ඉඩම් කොටසක ළිඳක් ඉදිකර ඇති බවත්, නමුත් තනි පුද්ගලයෙකු පමණක් මෙය ප්‍රයෝජනයට ගන්නා බවත්, එම නිසා පවුල් 30-40 කට ජලය ලබාගැනීමට නොහැකිව තිබෙන බවත් එබැවින් මේ සම්බන්ධව අවධානය යොමු කර එම ප්‍රදේශවාසී ජනතාවට ජලය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. ( මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් වෙත දැණුම් දීමට සභාව තීරණය කරන ලදී. ) මෙම නගර සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය යොදාගෙන ර/බුලත්ගම දෙමළ විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සකස් කිරීම වෙනුවෙන් 6900/- ක මුදලක් අයවිය යුතුව තිබෙන බව විගණනයේ දී අනාවරණය වී තිබෙන බව පැවසීය. එම විද්‍යාලයේ විදුහල්පතිතුමා මෙම නගර සභාවේ කටයුතු වලට සහයෝගය ලබාදෙන නිසා , ඒ සදහා වැය වු මුදල් වලින් නිදහස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

වැවේවත්ත ප්‍රජා ශාලාවේ විදුලිය කපා හැර ඇති බවත්, එම නිසා අදාල විදුලි බිල්පත ගෙවා විදුලි සම්බන්ධතාව ලබාගන්නා ලෙස ඉල්ලා සිටිමින් සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

**14.** <u>අවසානයඃ</u>

**<u>ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ</u>**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සදහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය පුදකරමින් ප.ව.02.30 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.